පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල
විෂය –නාට්‍ය හා රංග කලාව
දෙවන වාරය-ජූලි මාසය-1 සතිය
ශ්‍රේණිය –9
සැකසුම – චතුරිකා ප්‍රියදර්ශනී
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

**සති පාසල 9**

# බෞද්ධ පූජා කර්ම - I

## ආලවක දමනය.

- බෞද්ධ පූජා කර්ම පිළිබඳ ව අවබෝධ කරවීමේ දී පොත්පත් පරිහරණය කළ නොහැකි සාමාන්‍ය ජනතාවට ධර්මය පිළිබඳ අවබෝධ කර දීම පිණිස විවිධ බෞද්ධ කතා අනුකරනය කිරීම සහ එම කතාවල විවිධ අවස්ථා නිරූපණය කිරීම සඳහා ධර්ම කතික භික්ෂූන් වහන්සේලා ඇතුළු උපාසක පිරිස ක්‍රමවේදයක් අනුගමනය කර ඇත.

- ධර්ම දේශනය අතරමැද කොටස් උපාසකයින් ලවා නිරූපණය කර පෙන්වා ඇත. එමගින් කතාවේ අර්ථය සේම එහි ඇති ධර්ම කරුණු පිළිබඳව ද පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවිය.

ඒ සඳහා විශේෂ වූ බෞද්ධ ආගමික පූජා කර්ම කිහිපයකි.

1. ආලවක දමනය
2. මිලින්ද ප්‍රශ්නය
3. දොරකඩ හස්න
4. පිරිත් පිංකම
   (පාඩම සාකච්ඡාවේ දී වැඩි දුර සාකච්ඡා කෙරේ.)

## 1) ආලවක දමනය කතා වස්තුව

අලවුරට පාලනය කළ රජු මුව දඩයමේ ගිය විට ආලවක යක්ෂයා මුණ ගැසුණි. ඔහුගෙන් බේරීම සඳහා දිනපතා දරුවකු බැගින් බිලි දීමට පොරොන්දු වී රජු ආපසු යයි. මෙසේ රජුගේ දරුවා බිලි දීමට දිනය උදා විය. එය දැනගත් බුදුන්වහන්සේ එතනට වැඩම කළහ. බුදුන් දුටු විමානයේ මුරකරු වූ ගද්රඹ යක්ෂයා උන්වහන්සේ එතනින්

ඉවත් කිරීමට බොහෝ වෙහෙසුන ද එය කිරීමට නොහැකි විය. යක්ෂ සමාගමෙන් ආපසු පැමිණි අලවු යකු බුදුන් ඉදිරියේ සැර පරුෂ සේ හැසිරුණි.

උදා:- (ආලවක හා ගද්‍රභ යක්ෂයා අතර සංවාදය)

ගද්‍රභ : මේ විමානයට වැඩියේ ඇයි?
භික්ෂුව : උවමනාවක් නිසා තමයි ආවේ ඔබ ඉඩ දෙනවනම් මම කැමතියි මෙහි රාත්‍රිය ගත කරන්න
ගද්‍රභ : අනේ ස්වාමීනී, මේක ආලවකයගෙ විමානෙ. පේනව නේද? හැමතැන ම මිනී කාලා ලේයි ඇටකටු ගොඩයි. මෙතන හිටියොත් ඔබ වහන්සේට මොනවා වෙයි ද හිතාගන්න බෑ.

භික්ෂුව : යකාගෙ නපුරුකමින් මට වැඩක් නෑ මම අද මෙතන නවතිනවා.

මේ ආකාරයට යකා පැමිණි පසු ද කතා බහක යෙදෙයි. අවසානයේ දී යකා බණ අසා බුදුන් සරණ යයි. මෙම සිදුවීම සජීවීව ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කරනු ලබන අතර රඟපාන විට පෙන්විය නොහැකි දේ භික්ෂූන් වහන්සේලා විසින් දේශනා කරයි. භික්ෂූන් වහන්සේ විසින් බුදුන් වහන්සේ නියෝජනය කරයි....

මේ අවස්ථාවේ දී පසුබිමින් බෙර වාදනය ඇසේ පන්දම් මඟින් ආලෝකය ලබාදෙයි හූ හඬ නගාගෙන කලු රතු ඇඳුම් ඇදගෙන බෙර වාදනයට අනුව යක්ෂ වෙස් ගත් නළුවන් වේදිකාවට පැමිණේ.

## ආලවක දමනය තුළ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ,

- අනුකරණය - යක්ෂයා ලෙස ගිහියෙක් වෙස්ගෙන පැමිණ රඟ දැක්වීම.
- සමාරෝපය - යක්ෂයා ලෙස ඇඳුම් පැළඳුම් ඇඳ තිබීම.
- බුදුන් ලෙස භික්ෂුවක් පෙනී සිටීම.
- සංවාද භාවිතය - (ගද්‍රභ හා භික්ෂුව අතර සංවාදය)




- රංග භූමිය - පන්සලේ ධර්ම ශාලාව
- ප්‍රේක්ෂකයෝ - (උපාසක උපාසිකාවන්)

- සංගීතය - බෙර වාදනය
- ආලෝකය - පන්දම් එළි භාවිතය
- අංග රචනය - යකෙකු සේ මුහුණ සකස් කිරීම.
- වේෂභූෂණ - යකෙකු ලෙස ඇඳුම් ඇඳීම.
- නළු නිළියෝ - භික්ෂුව හා ගදුහ ලෙස පෙනීසිටි උපාසකයන්

මෙසේ නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවක් දැකිය හැකි අතර මෙම පූජා කර්මය තුළ ප්‍රාසාංගික ලක්ෂණ බොහෝමයක් ද දැකිය හැකිය.(පාඩම සාකච්ඡා කිරීමේ දී ඔබට විසතරාත්මක ව දැනගත හැකි වේ.

## <u>පැවරුම .</u>

1. **ඔබ දන්නා බෞද්ධ පූජා කර්මය හතරක් ලියන්න.**
2. **ආලවක දමනය නැමැති පූජා කර්මයට පාදක වූ කතාව කෙටියෙන් ලියා දක්වන්න.**
3. **එම බෞද්ධ පූජාකර්ම යෙහි පූජා කර්මයෙහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ ලියා දක්වන්න.**